# අන්නාසිවලින් වැඩියෙන් මුදල්: දැනුම සහ තොරතුරු දායකවෙයි

ශ්‍රී ලංකාවේ අන්නාසි වගාව කිසිම අධිකාරියක විශේෂ සහයෝගයක් නැතිව අනාථ තත්වයෙන් පැවතුනත් මුදල් උත්පාදනය අතින් ඉහල තත්වයක පවතී. අන්නාසි කර්මාන්තයට සම්බන්ධ විශේෂඥයින් බොහෝ දෙනෙකුගේ අදහස අනුව ශ්‍රී ලංකා අන්නාසි ලෝකයේ රසවත්ම අන්නාසි වර්ග . ලෝකයේ අන්නාසි නිෂ්පාදනය කරන රටවල් අතර ශ්‍රී ලංකාවට 37 වන ස්ථානය හිමිය.

ශ්‍රී ලංකාවේ අන්නාසි නිෂ්පාදකයින් විසින් මුහුණදෙන ගැටළු රාශියකි. මොටියන් ලෙස හැඳින්වෙන නිරෝගී අන්නාසි මුලාංකුර හිඟකම, විශේෂයෙන්ම පොහොර මිල අධිකවීම නිසා අධිකවී ඇති නිෂ්පාදන පිරිවැය, ඉහල අස්වනු ලබාදෙන ක්‍රම සහ මනා ශිල්පක්‍රම යොදානොගැනීම සහ අන්නාසි වගාකිරීම සඳහා ඉඩම් හිඟකම මෙහිලා ප්‍රධාන තැනක් ගන්නා බව හඳුනාගෙන තිබේ. නිෂ්පාදකයින්ගේ මෙම ගැටළු, ප්‍රමාණවත් සහ කලට වේලාවට සැපයුම් නොලැබීම හරහා අන්නාසි අපනයනකරුවන්ට සහ අන්නාසි යොදාගනිමින් වෙනත් නිෂ්පාදන කරන කර්මාන්තකරුවන්ට ද බලපෑම් ඇති කරයි.

| | | |
|---|---|---|
| අන්නාසි මූලාංකුර සපයන්නන්ගේ දත්ත පදනමක් පිහිටුවීම | ලුහුඬු දැන්වීම් ප්‍රශස්ත අයුරින් යොදාගනිමින් අන්නාසි වගාව සඳහා සුදුසු ඉඩම් ඉල්ලුම සහ සැපයුම ගැලපීම | වගාකරුවන් සහ මිලදී ගන්නා සමාගම් අතර ගිවිසුම් හරහා වගා ආරම්භකිරීම |
| පිළිගත් මනා වගා ක්‍රම අනුගමනය සඳහා අන්නාසි වගාකරුවන් ඒකරාශී කරවන තත්වයක් ඇතිකිරීම | | කාබනික පොහොර යොදා වගාකල අන්නාසි සඳහා වෙළඳපලක් නිර්මාණය කිරීම |

==============================================================================

**කීර්තිය පදනම් කරගත් ක්‍රමයක් අනුව අන්නාසි මූලාංකුර සපයන්නගේ දත්ත පදනමක් පිහිටුවීම**

දැනට පවතින තත්වය අනුව නව අන්නාසි වගාකරුවකුට නීරෝගී මූලාංකුර සොයාගැනීම සඳහා සාමාන්‍යයෙන් සති 6 ක පමණ කාලයක් ගතවේ. ඒ හැරුනුවිට නිරෝගි මුලාංකුර හඳුනාගැනීම සඳහා නව වගාකරුවකුට පලපුරුදු වගාකරුවකුගේ විශේෂඥතාවය මත විශ්වාසය තැබීමට සිදුවේ. ශ්‍රී ලංකාවේ කිසිදු අන්නාසි වගාවක් සම්පූර්ණයෙන් රෝගවලින් තොර නොවන්නේය යන සත්‍ය වටහාගන්නා අතරම කීර්තිය පදනම් කරගත් ශ්‍රේණිගත දත්ත පදනමක් තුලින් නිරෝගී පැල ලබාදීමෙහි වැඩි සැලකිල්ලක් දක්වන සැපයුම්කරුවන් සොයාගැනීම පහසු කරවයි. එමෙන්ම නිරෝගී මූලාංකුර සොයාගැනීම සඳහා වැයවන පිරිවැය ද අවම කරයි.

**පිළිගත් මනා වගා ක්‍රම අනුගමනය සඳහා අන්නාසි වගාකරුවන් ඒකරාශි කරවන තත්වයක් නිර්මාණය කිරීම**

අන්නාසි වගාවට සම්බන්ධ ව්‍යාප්ති සේවාවක් නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ අන්නාසි වගාකරුවන් වගාව පිළිබඳ දැනුම ලබාගන්නේ ප්‍රධාන වශයෙන්ම එකිනෙකාගෙනි. එකිනෙක වගාකරුවාගේ වගා ක්‍රම එකිනෙකින් වෙනස්ය. ලෝකයේ ප්‍රධානපෙලේ අන්නාසි වගාකරන රටවල් එකිනෙකින් බොහෝ සේ වෙනස් අනුගමනය කරති. එක් එක් වගාකරුවන් මෙසේ විවිධ ක්‍රම අනුව වගාකිරීම ශ්‍රී ලංකාවේ අන්නාසි වගාවේ පලදායීතාවයට අහිතකර අයුරින් බලපා තිබේ.

**ලුහුඬු දැන්වීම් (මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික) ප්‍රශස්ත අයුරින් යොදාගනිමින් අන්නාසි වගාව සඳහා සුදුසු ඉඩම් ඉල්ලුම සහ සැපයුම ගැලපීම**

අන්නාසි වගාව හේතුවෙන් ඉඩම් නිසරුවන බවට සාමාන්‍ය විශ්වාසයක් පවතී. එබැවින් සත්‍ය තත්වය පිළිබඳ අන්නාසි වගාවට සුදුසු ඉඩම් හිමිකරුවන් දැනුවත් කිරීම සඳහා ජනමාධ්‍ය යොදාගත හැක. ඒ හැරුනුවිට, ඉලෙක්ට්‍රොනික ලුහුඬු දැන්වීම් සහ සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍ය ලුහුඬු දැන්වීම් යොදාගනිමින් ඉඩම් හිමියන් සහ අන්නාසි වගාකරුවන් එකිනෙකා සමග යාකල හැකිය.

**වගාකරුවන් සහ ගැණුම්කරුවන් අතර ගිවිසුම් හරහා වගා ආරම්භකිරීම**

මේ ක්‍රමය හරහා සැපයුමේ විශ්වසනීයත්වය බොහෝදුරට ආරක්ෂා කරගත හැකිවේ. මෙහිදී ගැණුම්කරු විසින් වගාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ තාක්‍ෂණික උපදෙස් සපයන අතර නිෂ්පාදන සියල්ල මිලදී ගැනීම පිළිබඳව සහතිකයක් ලබාදෙනු ලබයි.

**කාබනිකව වගාකල අන්නාසි සඳහා වෙළඳපලක් නිර්මාණය කිරීම**

ශ්‍රී ලාංකික අන්නාසි වගාවේ අධික නිෂ්පාදන පිරිවැයට ප්‍රධානතම හේතුව වනුයේ රසායනික පොහොරවලට වැයවන මිලයි. කාබනික පොහොර යොදාගනිමින් අන්නාසි වගාකිරීමෙන් නිෂ්පාදන පිරිවැය අඩුකරගැනීමට හැකිවන අතර මෙසේ වගාකල නිෂ්පාදනවලට වැඩි මිලක් ද ලැබේ. කාබනික සහතික ලබාදීම නිවැරදිව සිදුකිරීම සහ කාබනික පොහොර යෙ බව සොයාගැනීමට හැකිබව අත්‍යවශ්‍යය.

***Contact: Nilusha Kapugama***
***nilusha@lirneasia.net***